sil-10-04-uns-059377-40x8-akw

WC - 1400

# ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වේ.**

## 1. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් HM 1-3 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජීය විද්‍යාව/ විද්‍යාව / රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

**සමග**

සමාජීය විද්‍යාව/ විද්‍යාව/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ තනතුරේ විෂය පථයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

2) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

**සහ**

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM 1-1) අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

- **වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016(I) - HM 1-3 රු .[86,865-15X2,270-120,915.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02 / 2016 (I) උපලේඛන II (A) අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 86,865.00.
- **අනෙකුත් වරප්‍රසාද** : මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව, වාහනයක් / ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව හා අනෙකුත් රජයේ අනුමත ප්‍රතිලාභ හිමිවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත් වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

## 2. අධ්‍යක්ෂ - නීති HM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම

**සමග**

නීතිය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා තිබීම

**සහ**

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ (MM)1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම.

## 3. අධ්‍යක්ෂ (නීතිය ක්‍රියාත්මක කිරීම) HM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2)**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අපරාධ විද්‍යාව හෝ නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම

**සමග**

පශ්චාත් උපාධි සුදුසුකමක් සපුරා තිබීම

**සහ**

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද ලබා තිබීම.

2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක්

**සමග**

අවම වශයෙන් වසර 12ක පොලිස් සේවයේ සේවය කර තිබීම හා එම කාලය තුල යටත් පිරිසෙන් අවුරුදු 05ක කාලයක් පොලිස් අධිකාරිවරයකු ලෙස සේවය කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

## 4. සායනික මනෝවිද්‍යාඥ HM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝවිද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්

**සමග**

සායනික මනෝවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම.

**සහ**

සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද සමග සායනික මනෝවිද්‍යාඥයෙකු ලෙස සායනික පසුබිමක අවුරුදු 2 ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමග සායනික මනෝවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**වෙනත් - ඉහත 2 , 3 හා 4 තනතුරු සඳහා පොදු කරුණු :**

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016(I) - HM1-1 රු .[80,295-15X2,270-114,345.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 (I) උපලේඛන II (A) අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 80,295.00
- **වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **අනෙකුත් වරප්‍රසාද** : මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව, වාහනයක් / ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව හා අනෙකුත් රජයේ අනුමත ප්‍රතිලාභ හිමිවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

## 5. සහකාර අධ්‍යක්ෂ - (මාධ්‍ය හා තොරතුරු) MM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජන සන්නිවේදනය / ජන මාධ්‍ය පිළිබඳ විශේෂ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් අදාළ උපාධියක්

**සහ**

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

## 6. සහකාර අධ්‍යක්ෂ - (නීතිය ක්‍රියාත්මක කිරීම) MM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අපරාධ විද්‍යාව හෝ නීතිය පිළිබඳ උපාධියක් සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම

**සහ**

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම.

**වෙනත් - ඉහත 5 හා 6 තනතුරු සඳහා පොදු කරුණු :**

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016 - MM1-1 රු .[53,175-10X1,375-15X1,910-95,575.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 53,175.00
- **වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත් වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

## 7. වැඩසටහන් නිලධාරී JM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යාව/ සමාජීය විද්‍යා /සෞඛ්‍ය ප්‍රවර්ධනය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ළමා ක්ෂේත්‍රයට අදාළ විෂයන් සහිත ඩිප්ලෝමාවක් හෝ උපදේශනය පිළිබඳ විෂයන් ඇතුළත් ඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත 1 හෝ 2 හෝ 3**

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ආශ්‍රිත නිලධාරි MA 03 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.
3) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1) II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

## 8. මාධ්‍ය හා තොරතුරු නිලධාරී JM 1-1 (තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජනමාධ්‍ය පිළිබඳ විශේෂ උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 01 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**පහත 1 හෝ 2 හෝ 3**

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ආශ්‍රිත නිලධාරි MA 03 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.
3) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2) IIශ්‍රේණියේ/ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1) IIශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

**වෙනත් - ඉහත 07 , 08 තනතුරු සඳහා පොදු කරුණු :**

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016 - JM1-1 රු .[42,600-10 X 755-18 X 1,135-70,580.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 42,600.00
- **වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත් වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

## ප්‍රතිලාභ

ඉහත සඳහන් සියලු තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හිමිවේ. එමෙන්ම සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවක භාරකාර අරමුදල සඳහා 3%ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

## පොදු කරුණු

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත වීම හා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියේ (www.childprotection.gov.lk) පළ කොට ඇති ආදර්ශ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර 2020 ඔක්තෝම්බර් මස 19 වන දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් පමණක් පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත්‍රය සමග උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්, ජාතික හැඳුනුම්පතේ/ විදේශ ගමන් බලපත්‍රයේ සහතික කළ පිටපතක් හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කළ හැකි සහතිකපත් වල සහතික කළ පිටපත්ද යොමු කළ යුතුය. යම් අයදුම්කරුවෙකු එක් තනතුරකට වඩා අයදුම්කරන්නේ නම් එම එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් වෙනම ලිපිකවරවල බහා යොමු කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර සඳහන් කර එවිය යුතු අතර, රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් යොමුකළ යුතුය.

ඉහත උපදෙස් අනුව ඉදිරිපත් කොට නොමැති, අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, මෙම තනතුරු ලබා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත කිරීමෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය / ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පත්වීම් සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,**
**නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල,**
**ශ්‍රී ජයවර්ධනපුර.**
**දුරකථන අංකය - 0112778911-14**
**වෙබ් අඩවිය -** www.childprotection.gov.lk